**සමස්ත ලංකා ශාසනාරක්ෂක අරමුදල - 2020**

----------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

සමස්ත ලංකා ශාසනාරක්ෂක අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සමුච්චිත අදායම් වෙනස්වීමේ සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට/ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය

කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**
---------------------------------------------------------------------

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**
-------------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 79 පරිච්ඡේදය පරිදි වර්ෂය තුල උපලබ්ධි වෙතැයි අපේක්ෂා නොකලත් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල උපලබ්ධි කිරීම පරිභෝජනය හෝ විකිණීම සඳහා තබාගෙන ඇති වත්කම් ජංගම වත්කම් ලෙස හෙලිදරව් කල යුතුයි. එසේ වුවද තොග පොත්වල සටහන් කර තිබූ, පිළිවෙලින් රු 179,500 ක හා රු 34,750 ක කොඩි හා ස්ටිකර් වටිනාකමද, තොග පොත්වල ඇතුළත් කර නොමැති රු 741,300 ක රෙදි කොඩි වටිනාකමද ප්‍රමිතය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | රු 179,500.ක් ,රු 34,750.ක් සහ රු 741,300.ක් වූ පිළිවෙලින් ඉතිරි කොඩි , ස්ටිකර් සහ මුද්‍රිත රෙදි කොඩි වටිනාකම පොත්වලට ගැනීමට සටහන් කර ගන්නා ලදි. | අදාල වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු බව. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උපචිත පදනම අනුව ස්ථාවර තැන්පතු පොළී ගණනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදි ස්ථාවර තැන්පතු වටිනාකම රු.1,001,458 කින් වැඩියෙන් හා ලැබිය යුතු පොළිය රු.1,070,491 ක් අඩුවෙන් ශේෂ පත්‍රයට ඇතුළත් කර තිබුණි. එම හේතුවෙන් වත්කම්වල ඇතිවූ රු. 63,033 ක ශුද්ධ අඩුවීම, 2019 වර්ෂයට අදාළව ලැබුණු පොළිය වූ රු.300,397 ක් සමාලෝචිත වර්ෂයේ පොළී ආදායමට ගැළපීම හා සමාලෝචිත වර්ෂයේ වැඩිපුර ගිණුම් ගතවූ රු.231,364 ක පොළී වටිනාකම මඟින් සමුච්චිත අරමුදල ගැලපී තිබුණි. | ඉදිරියේදී පොලි අදායම නිවැරදිව ගිණුම්ගත කිරීමට සටහන් කර ගනිමි. | අදාල පරිදි පොලි ආදායම් සම්බන්ධයෙන් ගැලපීම් සිදු කළ යුතු බව. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ අංක බෞ/කො/වා/04/01/2019 හා 2019 අප්‍රේල් 03 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය | කොඩි අලෙවි කිරීමට අදාළ මුදල් රැස් කිරීම හා බැංකු ගත කිරීම පිළිබඳ සාරාංශ වාර්තා සකස් කළ යුතු වුවත් එලෙස වාර්තා සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි කොඩි අලෙවි කිරීමේදී මෙම පෙන්වා දී ඇති ආකාරයට කටයුතු කිරීමට සටහන් කරගන්නා ලදි. | අදාල සාරාංශ වාර්තා සකස් කිරීම සිදු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,651,735 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.12,491,335 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,143,070 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට කොඩි විකුණුම් ආදායම සහ පරිත්‍යාග ආදායම පිළිවෙලින් රු.4,145,363 කින් සහ රු.10,000,000 කින් අඩුවීම සහ වියදම් රු.1,426,306 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂය වන විට බුදුපුත් මා පිය සුරක්ෂා ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා බුද්ධශාසන අමාත්‍යාංශය වෙත ලැබී තිබුණු අයදුම්පත් 748 ක් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ නිර්දේශ සහිතව නිවාස හා ඉදිකිරිම් අමාත්‍යාංශය වෙත යොමුකර තිබුණද, ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය සම්බන්ධව පසුවිපරම් කටයුතු කර නොතිබුණි. තවද 2018 වර්ෂය ආරම්භයේ සිට 2020 වර්ෂය අවසාන වන තෙක් අයදුම්පත් 50ක් ලැබී තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම වැඩසටහන රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව සිදු කරනු ලබන වැඩසටහනක් වන අතර 2020 සහ 2021 වර්ෂවල පැවති කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | බුදුපුත් සුරක්ෂා ප්‍රතිලාභ ලබා ගැනීම සම්බන්ධව පසු විපරම් කළ යුතු බව. |
| (ආ) | 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල (සංස්ථාගත කිරීමේ) පනතේ 6 ඡේදයේ (ඊ) උප ඡේදය ප්‍රකාරව, අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් නිලධාරීන් සහ සේවකයන් පත් කිරීම හා සේවයේ යෙදවීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි | අතිරේක කාර්ය මණ්ඩලයකට වැටුප් හා සේවක අර්ථසාධක මුදල් ගෙවීමට සමස්ත ලංකා ශාසනාරක්ෂක අරමුදලේ මුදල් සහ ක්‍රමවේදයක් නොමැති බැවින් තාවකාලික නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගෙන ඇති අතර ඉදිරියේදී ක්‍රමවේදයක් පිළියෙල කිරීමට සටහන් කර ගන්නා ලදි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**3.2 අරමුදලේ ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ ඉතිරිකිරීමේ, ජංගම හා ස්ථාවර තැන්පතු ගිණුම්වල රු.48,456,720 ක මුදලක් පැවතියද, අදාළ පරමාර්ථ ඉටු කිරීම සඳහා වැය කළ මුදල රු.7,504,130 ක් විය. ඒ අනුව, 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල (සංස්ථාගත කිරීමේ) පනතේ 3 ඡේදයේ (අ) සිට (ඒ) දක්වා උප ඡේද ප්‍රකාරව, අරමුදලේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අරමුදල කාර්යක්ෂමව යෙදවීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | රට තුළ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අරමුදල කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කරමි. | අරමුදලේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අරමුදල් කාර්යක්ෂමව යෙදවීම කෙරෙහි අවධානය යොමු කළ යුතු බව. |
| (ආ) 2012 වර්ෂයේදී රු.5,000,000 ක මූලික ප්‍රාග්ධනයක් සහිතව ආරම්භ කර තිබූ බුදුපුත් සුරක්ෂා උපහාර භාරයේ 2020 දෙසැම්බර් 31 දින වන විට රු.8,791,275 ක මුදලක් පැවතුණද භාරයේ අරමුණු ඉටුකර ගැනීමට අරමුදල් යෙදවීමට කටයුතු කර නොතිබුණි. | රට තුළ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් අරමුදලේ අරමුණු ළඟා කර ගැනීමට නොහැකි වූ අතර ඒ සම්බන්ධව ඉදිරියේදී කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදි. | අරමුදලේ අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු බව. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 (ආ) සහ 2009 ජූනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින්වත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි | අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට ක්‍රියා කළ යුතු බව. |